# ශ්‍රී ලාංකීය ටෙලිනාට්‍ය කලාව තුළ විකාශනය වන ඉන්දීය ටෙලිනාට්‍යය තුළ දැකිය හැකි ශානරීය ලක්ෂණ-සංසන්දනාත්මක අධ්‍යයනයක්

**Ms: Sadeeka Farween**
**Department of Languages, Faculty of Arts & Culture, SEUSL**
**Sadeekahameed@gmail.com**

**Abstract:**
ශානරය හා උපශානරය සාහිත්‍ය විචාර සංකල්ප අතර අපගේ අවධානයට ලක්වන්නාවූ ප්‍රබල සංකල්ප දෙකකි. ශානරය යන අදහස නතුන සාහිත්‍ය න්‍යාය වෙත පැමිණ ඇත්තේ "Genre" යන ප්‍රංශ වචනය තුළින්ය. උප ශානරය **"Sub-genre"** යනුවෙන් හඳුන්වයි. මෙම Genre යන පදය ඉංග්‍රීසි භාෂාවට අර්ථ ගැන්වීමේදී **"Kind / Sort / Category / Class / group / list "** යන වචන සියල්ලෙන්ම අදහස් වේ. සිංහල භාෂාවෙන් ප්‍රභේදය, වර්ග කිරීම වශයෙන් හැඳින්වූව ද ශානරය යනු හුදෙක් වර්ගීකරණය යන අදහස පමණක් ගැබ්වූවක් නොවන අතර ඊටත් වඩා ගැඹුරු අදහසක් ලබා දේ. ශානරය යනු ප්‍රධාන කොටසක් නැත්නම් වර්ගයක් ලෙස ගත හැකි අතර මෙහි අතුරු කොටස්, කුඩා කොටස් උප ශානර ලෙස දැක්විය හැකිය. උපශානර වලට ද ඊට අදාළ වන්නාවූ විවිධ වූ ලක්ෂණ ඇත. අධ්‍යනයේ පහසුව සඳහා ද මෙම ශානර හා උපශානර මෙන්ම එම ශානරීය ලක්ෂණ අදාළ කරගත හැකි ය. වර්තමානයේ මෙම ශානරීය හා උපශානරීය ලක්ෂණ එකිනෙක මිශ්‍ර වී පවතී. මෙය වර්තමාන ප්‍රවණතාවක් ලෙස දැකිය හැකි ය. ශ්‍රී ලාංකීය ටෙලිනාට්‍ය කලාව තුළ ඉන්දීය ටෙලිනාට්‍ය විකාශනය වර්තමානයේ බහුලව දැකිය හැකි ප්‍රවණතාවකි. ලාංකීය රූපවාහිනී නාලිකා තුළ විකාශනය වන ඉන්දීය ටෙලිනාට්‍යවල ශානරීය ලක්ෂණ අන්තර්ගත වේ. සැලැස්ම ,තේමාව, මාතෘකාව, භාව ප්‍රකාශනය, ආකෘතිය,ඉලක්කගත ග්‍රාහක පිරිස, අය වැය යනාදී ලක්ෂණ යටතේ එම ශානරීය ලක්ෂණ සාකච්ඡාවට බඳුන් කළ හැකිය. මෙම පර්යේෂණය තුළින් ද අපේක්ෂා කරනු ලබන්නේ ශ්‍රී ලාංකීය ටෙලිනාට්‍ය කලාව තුළ විකාශනය වන ඉන්දීය ටෙලිනාට්‍යවල ශානරීය ගති ලක්ෂණ අන්තර්ගත වේ ද සහ එම ලක්ෂණ කෙසේ නිරූපණය වන්නේ ද යන්න ශ්‍රී ලාංකීය ටෙලිනාට්‍ය කලාව තුළ විකාශනය වන ඉන්දීය ටෙලිනාට්‍ය ඇසුරින් සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් ද්විතික දත්ත පාදක කොටගෙන ඇත.

**Key words**: ශානරය,ටෙලිනාට්‍යය,ඉන්දීය,ප්‍රවණතාව,ලාංකීය

## Introduction:

සාහිත්‍ය විචාර සංකල්ප අතර අපගේ අවධානයට ලක්වන්නාවූ ප්‍රබල සංකල්ප දෙකක් ලෙස ශානරය හා උපශානරය දැකිය හැක. ශානරය යන අදහස නූතන සාහිත්‍ය න්‍යාය වෙත පැමිණ ඇත්තේ **"Genre"** යන ප්‍රංශ වචනය තුළින්ය. උප ශානරය **"Sub-genre"** යනුවෙන් හඳුන්වයි. මෙම Genre යන පදය ඉංග්‍රීසි භාෂාවට අර්ථ ගැන්වීමේදී **"Kind / Sort / Category / Class / group / list "** යන වචන සියල්ලෙන්ම අදහස් වේ. සිංහල භාෂාවෙන් ප්‍රභේදය, වර්ග කිරීම වශයෙන් හැඳින්වූව ද ශානරය යනු හුදෙක් වර්ගීකරණය යන අදහස පමණක් ගැබ්වූවක් නොවන අතර ඊටත් වඩා ගැඹුරු අදහසක් ලබා දේ. එක් එක් ශානරයට ආවේණික අර්ථ ඇති අතර කියවීමේදී ශානරය ව්‍යුහයට සාවධාන විය යුතුය යන කාරණාව ස්ථාපිත කිරීමට ශානරය යන න්‍යාය භාවිත කල යුතුව ඇත.එක් එක් ශානරය ගත් කල ඒ ඒ ශානරීය නීතිරීති, ව්‍යුහය, ආකෘතිය, සැලැස්ම හා ඒවයින් පාඨකයා අපේක්ෂා කරන දේ පිළිබඳ පොදු සම්මතයක් ඇත. රිඩඩ් බෝමන්ට අනුව ශානරයක් යනු ඓතිහාසික හා සමාජමය වශයෙන් සම්මත වූ කතිකා විශේෂයක් ලෙස දක්වයි.


**උදා- පන්සීය පනස් ජාතක කතාවල අඩංගු වන්නාවූ කතා විවිධ වූ තේමාවන් යටතේ එක්කර ඓතිහාසික අවස්ථාවක නිශ්චිත සමාජික කාර්යක් සඳහා රචනා වූවකි. මෙහි රචිතව ඇති මෙම කතා කිසියම් ශානරයක් තුලට අන්තර්ගත වේ.**

උක්ත නිදර්ශනය තුළින් ශානරය යන්නෙහි සරල අදහස පෙන්නුම් කෙරේ.

විවිධ වර්ගයේ ස්ථාවර ශානර තිබුනද සෑම විටකම එම ප්‍රධාන ශානර තුළ විවිධ උපශානර රැශියක් දැකිය හැකිය. ශානරය යනු ප්‍රධාන කොටසක් නැත්නම් වර්ගයක් ලෙස ගත හැකි අතර මෙහි අතුරු කොටස්, කුඩා කොටස් උපශානර ලෙස දැක්විය හැක. උපශානර වලටද ඊට අදාල වන්නාවූ විවිධ වූ ලක්ෂණ, ආකෘති, තේමා ඇත. අධ්‍යනයේ පහසුව

සඳහාද මෙම ශානර හා උපශානර මෙන්ම එම ශානර්ය ලක්ෂණ අදාල කරගත හැක. තවද අද මෙම ශානරීය හා උපශානරීය ලක්ෂණ එකිනෙක මිශ්‍ර වී පවතී. මෙය වර්තමාව ප්‍රවණතාවක් ලෙස දැකිය හැක.

**උදා- ලියුම ( ශානරය )** [1]




උක්ත දක්වා ඇති උදාහරණය තුළින් ශානරය උපශානරය යන්න පැහැදිලි වේ. ලියුම ශානරය වන අතර මෙහි සඳහන් වන ඉතිරි ලියුම් වර්ග උපශානර ලෙස හැඳින්විය හැක. මෙහි දක්වා ඇති ශානරය හා උපශානරය සතු ලක්ෂණ විවිධාකාර වේ. මෙහිදී උපශානර සියල්ලටම විවිධ වූ ලක්ෂණ අන්තර්ගත වේ. එමෙන්ම එහි අරමුණ, ආකෘතිය, පාඨක පිරිස, සැලැසම යනාදි පොදු අංග ද විවිධ ස්වරූපයෙන් පවතී. ලියුම පමණක් නොව නවකතා, චිත්‍රපට, ගීත යන සියලුම සාහිත්‍යය අංග වල ශානර මෙන්ම උපශානර දැකිය හැකිය.

**"ආරියවංශ රණවීර හයිතු කවි පරිවර්ථනයෙන්ද හයිතු වැනි කවි ලිවීමෙන්ද නව උපශානර මතුවීමට මඟ පෑදුනේය."**[1]

ශානරයන් යනු හුදු ආකෘතියන් නොවේ. නමුත් එක්තරා දෘෂ්ටිකෝණයකින් බලන කළ එය ආකෘතිය ලෙස සඳහන් කළ හැකිය.

**"ජී බී සේනානායක හා සිරි ගුණසිංහ නිසා නිසඳැස් හෝ නිදහස් පද්‍ය යැයි කිව හැකි උපශානරය මුල් අල්ලා ගියේය."**[2]

ශානර හා උපශානර අද වන විට සෑම සාහිත්‍ය අංගයකට පාහේ බිහි වී ඇත. ඒ ඔස්සේ සාහිත්‍යාංග ඍස විඳීමටදහැකියාවක් ලැබේ. එමෙන්ම විවිධ කලා නිර්මාණ වල තිබෙන්නා වූ වෙනස හඳුනා ගැනීමට ශානර විශාල ධාරිතාවක් සපයයි.

රූපවාහිනිය මඟින් ප්‍රදර්ශිත සියලුම නාට්‍යය පොදුවේ ටෙලිනාට්‍යය වශයෙන් හැඳින්විය හැකිය.එමෙන්ම ටෙලිනාට්‍යය වූ කල්හී කොටස් වශයෙන් නිරූපනය වන එසේ නැත්නම් විකාශනය වන නාට්‍යය විශේෂය ඒ නමින් හැඳින්වේ.එනම රූපරාමුවක් වුවද විවිධ තේමාවන් ඔස්සේ ආකෘතිමය එකඟතා මත විවිධ කාලවලදී විකාශනය වේ. ටෙලිනාට්‍යය ගත් කල බොහෝ දුරට දීර්ඝ වශයෙන් විකාශනය වන අතර ඒවායේ ස්වරූපය හා සමාජ බලපෑම එක් එක් සංස්කෘතිය අනුව වෙනස් වේ. ඒ ඒ සංස්කෘතියට අදාලව එම ටෙලිනාට්‍යය වල සමාජීය බලපෑම වෙනස් වේ. ටෙලිනාට්‍යය තුළින් හුදු ආස්වාදය පමණක් ප්‍රේක්ෂකයා අපේක්ෂා නොකරයි.කලාව තුළින් මිනිසාගේ හදවතට ආමන්ත්‍රණය කළ හැකිය.මිනිසාගේ කලා කෞෂල්‍යය දියුණු කළ හැකි මාර්ගයක් ලෙසත් සාර්ථක හා හොඳ ටෙලිනාට්‍යය දැක්විය හැකිය.සාර්ථක යන්නෙන් අදහස වඩාත් මුදල් ඉපැයූ ටෙලිනාට්‍යය නෙවන අතර මනුෂ්‍ය හදවත තුළ ඉඩ ලබා ඇති ටෙලිනාට්‍යය ලෙස හැඳින්විය හැකිය. එමෙන්ම ටෙලිනාට්‍යය කලාවන් අතර නොයෙකුත් වෙනස්කම් තිබුනද බොහෝ දුරට එම ටෙලිනාට්‍යය ගෙතී ඇත්තේ පවුලක් පාදක කරගෙනය. පවුල නැමැති සමාජ සංස්ථාව මූලික කොටගෙන යම් කතාවක් තුළින් හුදු විනෝදාස්වාදය පමණක් පදනම් කොට නොගත් සමාජයට සුදුසු පරිදි පණිවිඩයක් ලබා දීමට බොහෝ ටෙලිනාට්‍යය සමත් වී ඇත.

**"පවුල හා සම්බන්ධ පාරම්පරික සාරධර්ම මතුකොට දැක්වීමට ඇමරිකානු දිවාකාලීන ටෙලිනාට්‍යය මෙන්ම කොරියානු හා ජපන් ටෙලිනාට්‍යයද යන්න දරන බව පෙනේ."**[3]

---

[1]ඉන්ද්‍රානන්ද හිමි,ඉදුනිල්පුරර,ප්‍රඥොපයිනි, රන්කොත්ඔය, රජමහ විහාරය, තංගල්ල,2018,පිටුව:42

[2] ඉන්ද්‍රානන්ද හිමි,ඉදුනිල්පුරර,ප්‍රඥොපයිනි, රන්කොත්ඔය, රජමහ විහාරය, තංගල්ල,2018,පිටුව:42

[3] දිසානායක,විමල්,නව විචාර සංකල්පය, විසිදුනු ප්‍රකාශණයෝ, බොරලැස්ගමුව, 1වන මුද්‍රණය,2004,පිටුව:335

ලොක්යේ සෑම රයකම මෙන්ම ලංකාවේද ටෙලිනාට්‍යය මහත් සේ ජනලිය වී ඇත. ලාංකීය ටෙලිනාට්‍යය කලාව ප්‍රබල වීමට එම ටෙලිනාට්‍යය සතු පිටපත මෙන්ම අධ්‍යක්ෂවරයාද මූලිකත්වයක් දරයි. ඇතැම් අවස්ථාවල ඓතිහාසික කරුණු සම්බන්ධ කර තවත් අවස්ථාවක කාලීන තොරතුරු සම්බන්ධ කර තවත් අවස්ථාවල මනඃකල්පිත ලෝකයන් නිර්මාණය කිරීමටද ටෙලිනාට්‍යය නිපදවුම්කරු පෙළඹී ඇත.ශ්‍රී ලංකාවේ ටෙලිනාට්‍යයවල හා අර්ථාන්විතභාවය අතින් විවිධ ගණයට අයත් වන කෘති දක්නට ලැබෙන සඳහන් කළ හැකිය. සෝමවීර දිසානායක, තිලක් ජයරත්න, ධර්මසේන පතිරාජ, තිස්ස අබේසේකර, ප්‍රසන්න විතානගේ, අසෝක හඳගම වැනි දක්ෂ චිත්‍රපට අධ්‍යක්ෂවරු ටෙලිනාට්‍යයවල සම්බන්ධ වී සිටියහ. ඔවුන්ගේ දායකත්වයෙන් ටෙලිනාට්‍යයද ඉතා විශිෂ්ට නිර්මාණ ලෙස බිහිවුණෝය.එමෙන්ම ඇතැම් ටෙලිනාට්‍යය දේශ සීමා ඉක්මවා ජාත්‍යන්තර ක්ෂේත්‍රයට පිවිස ඇත.

ශ්‍රී ලාංකීය ටෙලිනාට්‍යය තුළ නව ප්‍රවණතාවක් ලෙස විදේශීය ටෙලිනාට්‍යය විකාශනය දැක්විය හැක. ජපන් නාට්‍ය, කොරියානු නාට්‍ය, ඉන්දියානු නාට්‍ය ආදී විවිධ සංස්කෘතිවලට අදාල නාට්‍යවල මිශ්‍ර වීමක් ලාංකීය ටෙලිනාට්‍යය තුළ දැකිය හැක.

**"එමෙන්ම ජපානයෙහි හා කොරියානෙහි නිෂ්පාදිත අතැම් ටෙලිනාට්‍යය වෙනත් බොහෝ ආසියාතික රටවල් වල පෙන්වූ ලැබේ."**[4]

මේ තුළින් ඔවුන්ගේ සිරිත් විරිත් සංස්කෘතිය ඇඳුම් පැළඳුම් හා කෑම බීම රටා වත් පිළිවෙත් ආදිය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලැබිය හැකිය.එපමණක් නොව තාක්ෂණයේ හා සන්නිවේදනයේ දියුණුවත් සමඟ ජාත්‍යන්තර තලයට ලඟා වීමට හැකියාව ලැබී ඇත.තවද වෙන වෙන රටවල විකාශනය වන්නා වූ වෙලාවට පාහේද එය නැරබීමට අවස්ථාව ලැබීම 21 වන සියවසේ ටෙලිවිෂන් කලාව තුළ දැකිය හැකි ප්‍රවණතාවකි.

ශ්‍රී ලාංකීය ටෙලිනාට්‍යය බොහෝ දුරට සංස්කෘතික හා සදාචාරය මෙන්ම ඇතැම් අවස්ථාවල ආගමික මුහුණුවරක් ගත් ඒවාද දැකිය හැක. සිනමාවේ උපශානරයක් ලෙස ටෙලිසිනමාගත් කළ එහි ඇත්තාවූ විවිධ මුහුණුවර පසුබිම්කොට ඒවාද විවිධ උපශානරවලට බෙදිය හැකිය.කලාව මිනිසුන් සඳහා ඇත්තාක් මෙන්ම ඇතැම් කලා කටයුතුවල පෝෂනය හේතුවෙන් කලාව කලාව සඳහාද යන්න බවද පැහැදිලි වේ. ටෙලිනාට්‍යය ක්ෂේත්‍රය අද වනවිට ඉතාමත් පොෂිත අංශයක් ලෙස දැකිය හැකිය. නිර්මාණකරුවන් ඔවුන්ගේ අත්දැකීම්, දැනුම, තාක්ෂණය, හැකියාව යන්න එක ලෙස සංකලනය කර නවතම ස්වරූපයේ නිර්මාණ ඉදිරිපත් කර ඇත.

**Results and Discussion:**

චිත්‍රපට හා රූපවාහිනිය පිළිබඳ ශානරීය ලක්ෂන පිළිබඳ විමසීමේදී කාටූන්, හොලිවුඩ්, බොලිවුඩ්, තේමා, ප්‍රේමාන්විත චිත්‍රපට, හාස්‍ය උපදවන චිත්‍රපට, සංගීත චිත්‍රපට, අපරාධ තේමා සහිත චිත්‍රපට හා ටෙලිනාට්‍යය වශයෙන් ශානර හෙවත් විවිධ තේමා යටතේ ප්‍රභේද කළ හැක. මේ එක් එක් වර්ගයට විවිධ වූ ලක්ෂණ අන්තර්ගත වේ.චිත්‍රපට හා රූපවාහිනී ටෙලිනාට්‍යයවල ශානරීය ලක්ෂණ පහත සඳහන් ආකාරයට වර්ග කළ හැක.

- ✓ **සැලැස්ම**
- ✓ **තේමාව**

- ✓ **මාතෘකාව**
- ✓ **භාව ප්‍රකාශනය**
- ✓ **ආකෘතිය**
- ✓ **ඉලක්කගත ග්‍රාහක පිරිස**
- ✓ **අය වැය**
- ✓ **කාලය**

[4] දිසානායක, විමල්,නව විචාර සංකල්පය, විසිදුණු ප්‍රකාශණයෝ, බොරලැස්ගමුව, 1වන මුද්‍රණය,2004,පිටුව:333

ඇමරිකානු සිනමා ඉතිහාසඥයෙකු වන ජෙනට් ස්ටේන්පර් ප්‍රකාශකර ඇත්තේ සිනමා ශානරය ශුද්ධ හා දෙමුහුන් ලෙසය. **"Pure and Hybrid genre"** උක්ත දක්වා ඇති කරුණු ප්‍රධාන වශයෙන් පදනම් කොටගෙන ටෙලිනාට්‍යය ශානරිය ලක්ෂණ සාකච්ජා කළ හැකිය.

ලංකාවේ විකාශනය වන ඉන්දියානු ටෙලිනාට්‍යය ශානරයන් ගැන විමර්ශනය කිරීමේදී ප්‍රධාන වශයෙන් උක්ත සඳහන් කරන අංශ යටතේ සාකච්ජා කළ හැකිය. මෙම ඉන්දියානු ටෙලිනාට්‍යය ගත්කල සිංහල හා දෙමළ භාෂා වලින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශවෙන් විකාශනය වේ. ඉන්දියානු ටෙලිනාට්‍යය ලංකාවට ඇතැමන් ඒවා ලැබෙන අතර ඇතැම් ටෙලිනාට්‍යය මිලදී ගනු ලැබේ. දමිල භාෂාව භාවිතා කරන්නන් සඳහා දමිල භාෂාව යොදාගෙන සමහර ටෙලිනාට්‍යය විකාශය වේ. නමුත් ලාංකීය බහුතරය භාවිතා කරන්නාවූ සංහල මාධ්‍යයෙන් හැම ජාලයකින් පාහේ එනම් සිරස ඔඩල දෙරන ඔඩල ඓහ ඔඩල ස්වර්ණවාහිනී මෙන්ම වර්තමානය වන විට රූපවාහිනියේද ඉන්දියානු ටෙලිනාට්‍යය විකාශනය වේ.මෙසේ ලංකාව තුළ විකාශනය වන්නාවූ ඉන්දියානු ටෙලිනාට්‍යය " බෝතල් කළ " seal කරන ලද යන ලෙස දක්වාලිය හැකිය. එසේ බොතල් කල යන්නෙන් අදහස ඉන්දියානු ටෙලිවිෂනය තුළ කිහිපවරක් විකාශනය වී, ප්‍රාන්තවල වෙනමම විකාශනය වී අවසානයේ රටේ සියලුම නාලිකා වල තිබූ සටහන් වලින් ඉවත් කර ඇසුරුම් කර තබයි. නමුත් මේවා නැවත නැවත නැරබිය හැකි ලෙස වෙනත් රටවල විකාශනය කළ හැකිය. මේ හෙයින් ලාංකීය ජනතාවටත් මෙම ශානරිය ලක්ෂණ ටෙලිනාට්‍යය නැරබීමට අවස්ථාවක් ලැබී ඇත.

එමෙන්ම ඉතා උසස් මට්ටමේ නාට්‍ය නිෂ්පාදනයට ලංකා රජය, හෝ අනුබද්ධිත ආයතන මූලිකත්වය ලබා දෙනුයේ අඩු වශයෙනි. එහෙයින් අඩු වියදමකින් විශාල කොටස් සංඛාවක් සහිත විශාල නිෂ්පාදන කළ ටෙලිනාට්‍යයක් ලංකාවට ලැබීම දෙවන ශානරිය ලක්ෂණය ලෙස දැක්විය හැක. මේ අයුරින් ලංකාවට ලැබෙන හා විකාශනය වන රූපවාහිනී ටෙලිනාට්‍යය ප්‍රධාන ශානර 02කට අදාළ වේ.

1.ඓතිහාසික කථාපුවත් තේමා කරගත් ටෙලිනාට්‍යය
2.ප්‍රේමය තේමා කරගත් ටෙලිනාට්‍යය

උක්ත දැක්වෙන ශානරයන් යටතේ ටෙලිනාට්‍යය විකාශනය වේ. සමාජ අවශ්‍යතාවය ප්‍රමුඛකරගත් ටෙලිනාට්‍යය තුළින් සමාජයට නිර්මාණකරු ඉතා සැහැල්ලුවෙන් ආමන්ත්‍රණය කරයි.

ප්‍රේමය මුල් කරගත් ටෙලිනාට්‍යය විකාශය වීමේ ප්‍රතිශතය අධික ලෙස සඳහන් කල හැකිය. එයට හේතුව බොහෝ දෙනා ඇලුම් කරන්නේද මෙම ප්‍රේමාන්විත ටෙලිනාට්‍යය මහා පරිමාණ ලෙස නිෂ්පාදනය කරන ලැබූ හා මෙම ටෙලිනාට්‍යය සියල්ල මෑදම්වැල් ගතය ටෙලිනාට්‍යය ලෙස හැඳින්විය හැක. රූපවාහිනී තාක්ෂණ භාෂාවට අනුව මෙය **Chain Teledrama** ලෙස හඳුන්වනු ලබන අතර ව්‍යවහාර භෂාවේ **Mega Teledrama** ලෙස හැඳින්වේ. ටෙලිනාට්‍යය යන්නෙහි අර්ථයම වන්නේ කොටස් වශයෙන් විකාශනය වන නාට්‍ය වන හෙයින් මෙම ප්‍රවර්නය තුළ කතාංග කොටස් (100) කට අධිකව නිර්මාණය වී විකාශණය වීමත් දැනගත හැකිය. මේ වන තුරුම විකාශනය වන්නාවූ ටෙලිනාට්‍යය හැම එක්කම පාහේ කොටස් 500ක් ඉක්මවූ ස්වරූපයකින්ය.මෑදම්වැල් ගතය ටෙලිනාට්‍යය යන්න අදහස් කරනු ලබන්නේද මිනිසුන්ගේ අවශ්‍යතාවය මත ඔවුන්ගේ නිෂ්පාදනයේදී නාට්‍යය පැයක හෝ පැයභාගයක කාලයක් සඳහා සීමා කර කොටස් වලට වෙන් කිරීම ලෙස දැකිය හැකිය. තවද යම් කිසි ටෙලිනාට්‍යයක කොටස් කැඩීමේදී අධ්‍යක්ෂකවරුන් මෙන්ම නිෂ්පාදන කණ්ඩායම් එය නිසියාකාරව සිදු කරයි.

ප්‍රේක්ෂකයන්ගේ අවධානය ලබා ගත යුතු අතර ඔවුන්ගේ බලාපොරොත්තු වලටද අදාලව මෙම නාට්‍යය කොටස් කර විකාශනය වේ. මෙම ශානරිය ලක්ෂණ බොහෝ ඉන්දියානු ටෙලිනාට්‍යය තුළ පෙන්නුම් කෙරේ. යම්කිසි කොටසක් ආරම්භ වන්නේද මිනිස් සිත් තුළට කාවදින ස්වරූපයෙන් වන අතර එම කොටස අවසන් වන්නේද පසු දිනයේ මෙය අනිවාර්යෙන්ම නැරඹිය යුතු අයුරින් අපේක්ෂා ඇතිකරවමින්ය. දැනට ලංකාවේ රූපවාහිනී නාලිකාවල විකාශනවන ඉන්දීය ප්‍රේමාන්විත ටෙලිනාට්‍යය ලෙස,

**ප්‍රේම දඩයම**

**මේ ආදරේ**

**ස්වප්නා**

**ආදරයයි මේ**

**හීනයක්ද මේ**

**ආදරෙයි මං ආදරෙයි**

දැක්විය හැකිය.

ප්‍රේමය මුල්කරගත් ටෙලිනාට්‍යය ඉන්දියානු ටෙලිනාට්‍යය තුළ මූලික ස්ථානයක් ගන්නා අතර ඓතිහාසික කතාපුවත් මුල්කරගත් කතාද දැකිය හැකි තවත් ශානරයක් ලෙස දැක්විය හැක. ඓතිහාසික වෘතාන්තයක් පදනම් කරගෙන ඊට අනුකූල ලෙස එයට සුදුසු නාමයක් යොදා මිනිසුන්ගේ නැත්නම් ප්‍රධාන ජනතාවගේ සිත්තුළට මෙය කාවැද්දීමට නිෂ්පාදක කණ්ඩායම් තැත් කරයි. ඓතිහාසික ටෙලිනාට්‍යය වලින් ලබා දෙන්නාවූ පණිවිඩය බොහෝ කුඩා දරුවන් ඉතා ඇල්මෙන් නරඹයි. දරුවන්ට මෙය ඔවුන්ගේ කුඩා ලෝකය සිසරා යන මනඃකල්පිත ලොවක් නිර්මාණය කරයි.ඉන්දියාව තුළ නිෂ්පාදනය වී එහි විකාශනය වී ප්‍රසිද්ධ වීමෙන් අනතුරුව ලංකාව මෙන්ම වෙනත් රටවල්වල විකාශනය වේ.
**"වර්ෂ 1987 දී ප්‍රදර්ශනය කරන ලද රාමානන්ද සාගර්ගේ රාමායනය ඉන්දියාව පුරා මහත් ආන්දෝලනයක් ඇති කළේය. එය දේශපාලනය ලෙරෙහි දැඩි බලපෑමක් කිරීමට සමත් විය.රාමායණය තරම් ජනප්‍රිය රූපවාහිනී වැඩසටහන් ඉන්දියාවේ නොවීය."**[5]
වර්තමානයේ මෙන්ම පසුගිය වර්ෂ තුළ විකාශනය වූ ඓතිහාසික ටෙලිනාට්‍යය ලෙස,

**ගෞතම සිද්ධාර්ථ**

**ජෝදා අක්බර්**

**අධිරාජ ධර්මාශෝක**

**රාමායණය**

දැක්විය හැකිය. උක්ත සඳහන් කරන ලද සිනමාවේ ශානරයක් වන ටෙලිනාට්‍යය වල උපශානර ලෙස ප්‍රේමාන්විත හා ඓතිහාසික ටෙලිනාට්‍යය පෙන්වාදිය හැක. මෙම ටෙලිනාට්‍යය වල ශානරීය ලක්ෂණ ලෙස මෙලෙස කොටස් වශයෙන් විකාශනය වීම හැම ඉන්දියානු ටෙලිනාට්‍යයකම පාහේ දැකිය හැකිය.
රූපවාහිනී ටෙලිනාට්‍යය ලාංකිය සමාජයට ගැලපෙන පරිදි සකස් කිරීමේදී සැලසුම් ශානරය පිළිබඳ සාකච්ඡා කළ හැකිය. ලාංකීය රූපවාහිනී නාලිකා වල මෙම ඉන්දීය ටෙලිනාට්‍යය අංශ කාහාපයකම කොටස් කල හැකිය.එනම් නාට්‍ය වල සැලසුම අංශය පදනම් කොට මනා ලෙස ලාංකීය සමාජයට උචිත අයුරින් සැලසුම් කොට ඇත්ද යන්න.

**විකාශනය වන කාලය**
**ඉලක්ක ගත ප්‍රේක්ෂකයන්**
**ටෙලිනාට්‍යය ආකෘතිය**
**තේමාව**

යන අංශ ඔස්සේ සාකච්ඡා කළ හැකිය. විකාශනය වන කාලය ගැන සැලකීමේදී බොහෝ දුරට එක් කොටසක් විකාශනය වන්නේ පැය භාගයක කාල සීමාවකදිය. එහිදී විනාඩි 20ක කාලයක් ටෙලිනාට්‍යය විකාශනය වන අතර විනාඩි 10ක් වෙළඳ දැන්වීම් සඳහා යොදා ගැනේ. කෙසේ වුවද ඉන්දියානු ටෙලිනාට්‍යය රාත්‍රි 7 - 10 දක්වා කාලය බොහෝ දුරට එම ජාලකොට පාහේ විකාශනය වේ. එනම් මෙය චදදර එසපැ ලෙස එසේ නම් උච්ච ප්‍රේක්ෂක පිරිසක් සහිත කාලය මෙය වන අතර කාර්ය බහුල ලාංකීය සමාජය තුල මෙය ඔවුන්ගේ විවේක කාලය ලෙස සඳහන් කල එකිය. සෑම මාධ්‍ය ජාලයකම පාහේ මෙම කාලය තුළ විකාශනය වීම ප්‍රබල ශානර්ය ලක්ෂණයක් ලෙස ගත හැකි අතර මෙහිදී ප්‍රේක්ෂකයා සතුව කුමන නාට්‍ය නරඹන්නේද යන ගැලුව උද්ගත වේ.

ඉලක්කගත ප්‍රේක්ෂක පිරිස ගැන විමසීමේදී බොහෝ ටෙලිනාට්‍යය පවුල් සංස්ථාව මූලික කරගෙන රචනා වේ.ඒ හේතුව වන පවුලේ සෑම දෙනෙකුට බොහෝ ටෙලිනාට්‍යය නැරඹිය හැක. කාර්යබහුල ජීවිතයෙන් මිදී විවේක කාලය නැත්නම් රත්‍රී ආහාර වේලාව අසාල කරගෙන මෙම සෑම ටෙලිනාට්‍යයන් නිරූපනය ඊට හේතු කොටගෙන පවුලේ සියලු දෙන්ම මෙම ඉන්දියානු ටෙලිනාට්‍යය නැරඹීමේ ප්‍රවණතාවය වැඩීය. එසේ නමුත් ප්‍රේමාන්විත ටෙලිනාට්‍යයන් බොහෝ ස්ත්‍රීන් ප්‍රිය

[5] දිසානායක, විමල්,නව විචාර සංකල්පය, විසිදුනු ප්‍රකාශණයෝ, බොරලැස්ගමුව, 1වන මුද්‍රණය,2004,පිටුව:334

කරන අතර ඔවුන්ට උචිත පරිදි මෙම ඉන්දියානු ටෙලිනාට්‍යය සකස් වී ඇත. ගෘහනියන් බොහෝදුරට මෙම කාලවේලාව ඒ සඳහාම දෛනිකව යොදාගනී. ලාංකීය මධ්‍ය ජාල වල විකාශනය වන බොහෝ ටෙලිනාට්‍යය **ස්වප්නා, ආදරයයි මේ, හීනයක්ද මේ, ආදරෙයි මං ආදරෙයි** කාන්තාවන් ආමන්ත්‍රණය කරන අතර පසුගිය වර්ෂතුළ විකාශනය වූ **ශාන්ති, ප්‍රවීනා, මහගෙදර** මෙම ලක්ෂණ උසුලයි. සෑම ටෙලිනාට්‍යයම පාහේ එකම පිරිසක් ඉලක්කගත කිරීම ලාංකීය ටෙලිනාට්‍යය ජාලය තුළ ඉන්දියානු ටෙලිනාට්‍යය උසුලන ප්‍රසිද්ධියට හේතුවක් ලෙස දැක්විය හැක.

ලාංකීය ටෙලිනාට්‍යය ජාලය තුළ එැට් එැකාරප් ලෙස හදුන්වන මෙම ඉන්දියානු ටෙලිනාට්‍යය තුළ අන්තර්ගත වන්නාවූ ආකෘතිය බොහෝ දුරට එක සමාන බවක් උසුලයි. ආකෘතිය ලෙස ගත්කල මෙම ටෙලිනාට්‍යයවල පසුබිම් තලය කෙසේ සකස් වී ඇත්ද යන්න බැලිය හැකිය. ඉතා දැවැන්ත ස්වරූපයේ මන්දිර වැනි ගෙවල් මෙන්ම ඊට අදාලව නවීන පන්නරයේ ගෘහභාණ්ඩ මෙම සෑම කතාවකම පසුබිම්තලයේ දැකිය හැකිය. ඊට අනුකූලව වර්ණ සංයෝජනයන් මෙහි එන ශනර්ය ලක්ෂණයන් දැක්විය හැකිය. තවද මෙමෙ නවීන පන්නරයේ නිවෙස් වල පිහිනුම් තටාක, අලංකාර ලෙස මල් වවන ලද උයන් සහා ඉතා විශාල ගේට්ටු වැනි ලක්ෂණද දැකිය හැකිය. අන්වාර්ය ලක්ෂණයක් ලෙස මෝටර් රථ එකක් හෝ එකකට වැඩිය දැකිය හැකිය.තවද ආකෘතිය ගැන සාකච්ජා කිරීමේ දී එහි එන චරිත වල ආකෘතිය ගැන අනිවාර්යෙන්ම බැලිය යුතුය. මෙම ඉන්දියානු ටෙලිනාට්‍යය වල ඉලක්කගත ප්‍රේක්ෂක පිරිස කාන්තාවන් වන හෙයින් ඔවුන් ප්‍රිය කරන අන්දමේ නවීන විලාසිතා සාරි ආභරණ කොණ්ඩා විලාසිතා වලින් සමන්විත ස්ත්‍රී චරිත දැකගත හැකිය. ඊට අමතරව එහි එන පිරිමි චරිතද අඳින්නේ ඉතා මිල අධික කබා ස්වරූපයේ ඇදුම්ය. ආකෘතිය අතින් ගත්කල ලාංකීය රූපවාහිනිය තුළ නිර්මාණය වන්නාවූ සෑම ටෙලිනාට්‍යයක්ම පාහේ උක්ත සඳහන් කරන ලද ශානර්ය ලක්ෂණය දැකිය හැකිය.

ඊන්දියානු ටෙලිනාට්‍යයවල ප්‍රධාන ශානර වර්ග 02 ක් දැකිය හැකි බව මීට ප්‍රථම සඳහන් කරන ලදී. ඒවා නම් ප්‍රේමාන්විත හා ඓතිහාසික තළය මත සිට විකාෂනය වන්නාවූ ටෙලිනාට්‍යය ලෙස දැක්විය හැකිය. ලාංකීය රූපවාහිනිය තුළ විශාල වශයෙන් විකාශනය වන්නේ ප්‍රේමාන්විත ටෙලිනාට්‍යය වන අතර අතරින් පතර කාලයට උචිත පරිදි ඓතිහාසික ටෙලිනාට්‍යය විකාශනය වේ. මෙම ටෙලිනාට්‍යය දෙවර්ගයේම තේමාව ගත්කල දෙයාකාර වේ. නමුත් උක්ත සඳහන් ආකෘතිය බොහෝ දුරට සමාන වේ. ඉන්දියානු ටෙලිනාට්‍යයවල ශානරිය ලක්ෂණයන් තේමාව ගත්කල ශ්‍රී ලංකාව තුළ විකාශනය වන 90% පමණ ඉන්දියානු ටෙලිනාට්‍යයවල ප්‍රේමය පදනම් කොටගත් ඒවා වේ. මෙසේ ප්‍රකාශ කිරීමට හේතුව එහි ගැබ්ව ඇති කතාව ලෙස හැඳින්විය හැකි නමුත් කතාව රසවිඳීමට පෙර මෙම කතා ආරම්භයේ වාදනය වන්නාවූ තේම ගීතය ඊට ප්‍රබල හේතුව ලෙස ගත හැකිය. එම තේම ගීත ඛණ්ඩය ඇසුරින් ප්‍රේමාන්විත නාට්‍යයක් බව හැගේ. එමෙන්ම එම තේමා ගීත ඛණ්ඩය කතාව විකාශනය වන අතරින් පතරත් යෙදේ. කතාව විකාශනය වන එම තේමා ගීත ඛණ්ඩය වාදනය වන්නේ නම් එන ප්‍රධාන නළුවා (Hero) සහ නිළිය (Heroine) හමුවීමත් සිපගැනීමක් හෝ වැළඳ ගැනීමක් පෙන්නුම් කරන අවස්ථාවේ ඔවුන්ගේ ප්‍රේමය සංකේතාර්ථ පෙන්නුම් කිරීමක් බදුය. එලෙස වාදනය වන්නා වූ තේමා ගීත පිරික්සීමෙන් මෙය පැහැදිලි වේ.

උදා -

මේ ආදරයයි - **මල් දුන්නෙන් මා වෙත හීයක් එවා හී සැරය මා**

**සිත වෙනසක් කරා**

**පෙම්බැන්දේ ඇයි මට රහසක් කියා ඔබ**

**හින්දා මා දුර ගමනක් ගියා ඒ ආදරේ**

**කතාවයි අපේ**

**මේ ආදරයයි මේ ආදරයය ……………….**

ස්වප්නා - **ස්වප්නා ස්වප්නා**

**දුහුල් මාරුතේ වෙලී මා ගතේ**

**පැතුම් මෝදු වීලා සැදෑ යාමයේ**

**හැඟුම් මාවතේ තුරුල් වී හදේ**

**මවා ගත්ත ලෝකේ හැබෑ වී මගේ ………………….**

ප්‍රේම දඩයම - **ආදර හිත් තෙතමනේ**

**ජීවිතේ අරුතක් සොයා**

**ළං වී ඉන්න මා ළඟ සඳා**

**රෝස මල් යහනා තනා ………………………..**

සඳහටම ඔබ මගේ - **හැංගීලා ආදරේ**
**කියන්නත් ලෝභ නෑ**
**ආදරේ ආදරේ සදහටම ඔබ**
**මගේ............**

උක්ත සඳහන් ගීත බණ්ඩ බැලීමේදී තේමාව පාදක කොටගත් ශානර්ය පක්ෂණාට ඉතා පැහැදිලි ලෙස ප්‍රත්‍යක්ෂ වේ. එමෙන්ම තවත් ප්‍රධාන තේමාවක් ලෙස ඓතිහාසික වස්තු විෂය පදනම් කොටගත් කතා හැඳින්විය හැක. මෙම පදනමේ සිට නිශ්පාදනය වන්නාවූ සියළුම ටෙලිනාට්‍යය පසුතල නිර්මාණයේ සිට තේමාවද එම සමාන බවක් උසුලයි. මෙහි ප්‍රධාන තේමා ලෙස ඓතිහාසික වෘතාන්තයක් මුල් කොට රචනා වූවක් ලෙස සඳහන් කළ හැකිය. ලාංකීය රූපවාහිනිය තුළ විකාශනය වන්නා වූ ඉන්දීය ඓතිහාසික ටෙලිනාට්‍යය තුළ අන්තර්ගත තේමාව විමසා බැලීමෙන් මෙය තවදුරටත් තහවුරු කරගතහැකි වේ.

උදා -

**ගෞතම සිද්ධාර්ථ - අප මහා බුදුරජාණන් වහන්සේගේ කුමාර අවධිය පසුබිම් කොටගත් ටෙලිනාට්‍යයකි.**

**ජෝදා අක්බර් - මුස්ලිම් ජාතික රජු අක්බර් හා හින්දු අගමෙහෙසිය පදනම් කරගත් ප්‍රේමාන්විත කථා පුවත මෙන්ම අක්බර් රජ සමය යුධ කටයුතු පරිපාලනය වැනි ඓතිහාසික තොරතුරු රැගත් කථාවෘතාන්තයකි.**

**රාමායනය - රාම රාවණා යුද්ධය මෙන්මරාම සීතා ප්‍රේමය කැටිකොටගත් කථාමාලාවකි.**

**අධිරාජ අශෝක - අශෝක රජුගේ කුඩා අවධියේ සිටම ඔහු රජ වී රට පාලනය කළ ආකාරය පමණ අන්තර්ගත වේ.**

මහා භාරතය **- ශාක්‍ය කෝලිය වාංශිකයන්ගේ යුද්ධය මුල්කරගත් ඉන්දියානු පූරාවෘත්තය අඩංගු නාමයෙන් ලෙස දැක්විය හැක.**

ලාංකීය රූපවාහිනිය තුළ විකාශනය වන ඉන්දීය ටෙලිනාට්‍යය විමසා බැලීමේදී එහි දැකිය හැකි තවත් ශානරීය ලක්ෂණයක් ලෙස මෙම ටෙලිනාට්‍යය වල තේමා පාඨයන් එනම් කතාවේ නම අදාල කරගත හැකිය. නාට්‍යයන් ප්‍රේමය පදනම්කොට ගෙන තිබේ. **ස්වප්නා, ආදරයයි මේ, හීනයක්ද මේ, ආදරෙයි මං ආදරෙයි** තවද රටේ බල නාමය රණශූර බව ඓතිහාසික පෞඩත්වය ඓතිහාසික වෘතාන්ත නම් ඊට අනුකූලව **අශෝක අධිරාජ්‍ය ගෞතම සිද්ධාර්ථ ජෝදා අක්බර් රාමායනය මහාභාරතය චන්ඳ නන්දනී** ලෙස නාට්‍යයන් උචිත නම් ලබා දීම මෙම නාට්‍යයන්ගේ ශානර්ය ලක්ෂණයන් ලෙස දැක්විය හැකිය.

දැනට විකාශනය වන මෙන්ම පසුගිය වකවානුව තුළ විකාශනය වූ ටෙලිනාට්‍යය පරික්ෂා කර බැලීමේදී ඉන්දියාව පුරුෂාධිපත්‍ය සමාජයක් වූවද ස්ත්‍රිය ප්‍රධාන කොටගත් කතා බව පැහැදිලි වේ. එනම් ස්ත්‍රී චරිතය මූලික කොට ගෙන එම ටෙලිනාට්‍යය නිෂ්පාදනය වී ඇත.

උදා:

- මේ ආදරයයි කථාවේ ප්‍රධාන චරිතය දොස්තර ඉෂිතා වේ.
- ස්වප්නා කථාවේ ප්‍රධාන චරිතය පොලිස් නිළධාරිනියක් වන ස්වප්නා වේ.
- ප්‍රවීණා කථාවේ ප්‍රධාන චරිතය ගෘහනිර්මණ ශිල්පිනියක් වන ප්‍රවීණා වේ.

යථාර්ථයේදී ස්ත්‍රිය සතුව සමාජයේ එවැනි ස්ථානයක් නොමැති වූවද රූපනයේදී ස්ත්‍රියට උසස් ස්ථානයක් සෑම නාට්‍යයකම පාහේ ලබා දී ඇත. බොහෝ ස්ත්‍රීන් රැකියාවන් කරන ආකාරයේ චරිතය සජීවීකරණයට ලක්කොට ඇත. ස්ත්‍රිය සතුව හැම බලයක්ම පවතින ආකරයේ බලතල දී චරිතය ගොඩනගා ඇත. ලාංකීය රූපවාහිනිය තුළ දක්නට ලැබෙන සෑම නාට්‍යයක්ම පාහේ මෙම ලක්ෂණය දැකිය හැකිය.තවද මෙම ඉන්දියානු ටෙලිනාට්‍යය වල ආගමික අංශයට මූලිකත්වයක් ලබා දේ. සෑම නාට්‍යයකම පාහේ ආගමික පූජා දේවාලයට යෑම සෑම සුභ කාර්යක්ම ආගමික පූජාවකින් ආරම්භ කිරිම දෛනිකව සිදු කරන ආගමික කටයුතු සිදු කිරිම වැනි දේ බහුලන මෙමෙ නාට්‍යයන් තුළ දැකිය හැකිය. ප්‍රේමාන්මිත මෙන්ම ඓතිහාසික වෘතාන්ත කැටිකොටගත් නිර්මාණවල පාහේ ආගමික අංශයට මූලිකත්වයක් ලබා දේ. ආගම සමඟ බැදුනු සංස්කෘතික ලක්ෂණ රාෂියක් මෙම ටෙලිනාට්‍යය තුළ දැකිය හැකිය. නිවෙස් තුළ දේවාලයක් නැතනම් දේව පින්තූර රැගත් කාමරයක් අනිවාර්යෙන්ම කත්ව තුළ අන්තර්ගත වන්නේ ඔවුනගේ ආගම හා සංස්කෘතිය ආරක්ෂා කිරිමේ අභිමත්ර්ථයෙන් විය හැකිය. මෙයද ශානරීය ලක්ෂණක් ලෙස ප්‍රධාන වශයෙන් මෙම ටෙලිනාට්‍යය වල

දැකිය හැකිය. එමෙන්ම බොහෝ දුරට විස්තෘත පවුල් සුවරූපයක් හා බැඳුණු සියලුම සංස්කෘතික අංග කෙරෙහි වඩාත්ම අවධානය යොමු කිරීමත් සෑම ටෙලිනාට්‍යයකම පාහේ දැකිය හැකිය.
තවත් ප්‍රබල ලක්ෂණයක් ලෙස මෙම නාට්‍යන් තාක්ෂණික අංශය විමසිය යුතුය. එනම් නාට්‍ය සංස්කරණය , කැමරාකරණය, සජීවීකරණය, ආලෝකකරණය, හඬකැවීම්, ආදිය අංශ සියුම් අංශ වුවද ටෙලිනාට්‍යයක සාර්ථකත්වය රඳා පවතින්නේ සියලු අංශ පදනම්වය. සමීප රූපතල ( close up) අති සමීප රූපතල :Extrem close up) මධ්‍ය සමීප රූප ( mid close up) දුරස්ථ රූප ( long shot) අති දුර රූප ( Exrem long shot) අහසේ සිට භූමිය දකින ( Bird view) යන රටාව අංශ ඔස්සේ කැමරාකරණයේදී මෙන්ම සංස්කරණයේදී යොදා ගත හැකිය. විවිධ අවස්ථාවල විවිධ දෘෂ්ඨිකෝණයන්ට අනුව මෙම ක්‍රියාවලින් සිදුකිරිම දැකිය හැකිය. තවද ඓතිහාසික කතාවස්තු වල Animation සජීවිකරණ ක්‍රියාවලිය බහුලව දැකිය හැකිය. තවද නාටය සාර්ථක භාවයට ආලෝකකරණ සිද්ධන්තයද ප්‍රබල ලෙස බලපායි. මෙහිද අඩු වැඩි වශයෙන් ආලෝකය යොදා ගනනා අතර ඇතැම් ඓතිහාසික වෘතාන්ත සඳහා ආලෝක පරාවර්ථක පුවරු ( light reflection bords) භාවිතයෙන් විශාල දර්ශණ තලවලට ආලෝකය නිවැරදි ලෙස ස්ථානගත කිරීමක් දැකිය හැක. හඬකැවීම් සිදුකිරීමද චරිතයට ඔබින පරිදි රාමු ගත කිරීමක් දැකගත හැකිය. සියුම් හෝ තාක්ෂණික දෝෂයකින් වූවද සම්පූර්ණ නාට්‍යය පලුදු විමට ඉඩ ඇත. එනමුත් ලාංකීය රූපවාහිනිය තුළ අධි තාක්ෂණික මෙවලම් උපයෝගි කරගනිමින් ප්‍රබල නිෂ්පාදනයක් කර ඇති බව පෙනේ.

ලාංකිය රූපවාහිය තුළ විකාශනය වන්නා වූ මෙම ටෙලිනාට්‍යය නිරීක්ෂණයේදී දැකිය හැකි තවත් අංශයක් ලෙස මේ සඳහා වැය කරන්නා වූ මුදල ගැන සාකච්ජා කල හැකිය. එනම් ටෙලිනාට්‍යය නිෂ්පාදනයට විශාල පිරිවැයක් යොදා ගනී. ඊට හේතුව පැට් මහා පරිමාණ ලෙස ආකෘතිය නිර්මාණය කිරිම හා කොටස් 100 පසු කරමින්ද විකාශනය වන හෙයින් බව සරලව සඳහන් කල හැකිය.එමෙන්ම මෙම පසුබිම්තල සඳහා, විවිධ දර්ශණ සඳහා, නළු නිලියන් ඇඳුම්, ආභරණ, වේෂ නිරූපණය උදෙසා, විශාල මුදලක් වැය කර තිබිමත් දැකිය හැකිය. ප්‍රේමාන්විත ටෙලිනාට්‍යය වලට පමණක් නොව ඓතිහාසික වෘතාන්ත වලටද ඉතා විශාල වියදමක් දරයි.එයට හේතුව එම සජීවිකරණය සඳහා දර්ශණතල නිර්මාණයට, අවි ආයුධ, සහය නළු නිලියන්, වස්ත්‍රාභරණ ආදිය සඳහා විශාල වියදමක් දරා සිදුකර ඇති බව ලාංකීය රූපවාහිනිය තුළ විකාශනය වන ඉන්දියානු ටෙලිනාට්‍යය සියල්ලම පාහේ දැකිය හැකිය.
වියදම සලකා බැලීමේදී ආකෘතිය හෙවත් දර්ශන තලය සැකසීමේදී විශාල වශයෙන් මුදල් යොදා ගන්නා අතර වේෂ නිරූපන කාර්යටද ඊට නොදෙවෙනිව වියදම් කරයි. ඉන්දියානු ටෙලිනාට්‍යය වල වේෂ නිරූපනය සඳහා මූලිකත්වයක් දෙයි. කාන්තාවන් සඳහා යොදාගනු ලබන වේෂ නිරූපණය ඉතා විශිෂ්ඨය. අවස්ථාවට උචිත පරිදි විවිධ දෘෂ්ටිකෝණ මත සිට වේෂ නිරූපණය කිරීමට වේෂ නිරූපණ ශිල්පියා මහත් වෙහෙසක් දරයි. වේෂ නිරූපණය සඳහා භාවිතා කරන්නා වූ ආභරණ, හිස්වැසුම්, රැවුල්, කොණ්ඩා, පාවහන් ආදිය අධික ලෙස ඉන්දියානු ටෙලිනාට්‍යය වල දැකිය හැකිය. ප්‍රේමාන්විත ටෙලිනාට්‍යය වලට වඩා ඓතිහාසික වෘතාන්ත රැගත් ටෙලිනාට්‍යය බහුලව භාවිතා කෙරෙන බව එම නාට්‍ය නැරඹිමේදී පැහැදිලි වේ. එමෙන්ම මෙම නාට්‍ය වේෂ නිරූපණ අවස්ථා එනම් ඊතල විදීම්, ලේ ගැලීම්, තුවාල, පිපිරීම්, රිය අනතුරු වැනි අවස්ථා නිරූපණයන් බහුලව මෙම ටෙලිනාට්‍යය වල දැකිය හැකිය. වේෂ නිරූපණය සඳහා මූලිකත්වයක් මෙම ඉන්දියානු නාට්‍යවල දකින්නට ලැබිම එහි ශානරීය ලක්ෂණයක් ලෙස දැකිය හැකිය.

**Conclusion:**

සැලැස්ම ,තේමාව, මාතෘකාව, භාව ප්‍රකාශනය, ආකෘතිය,ඉලක්කගත ග්‍රාහක පිරිස, අය වැය ආදී ,ලක්ෂණයන් සංසන්දනාත්මකව පරික්ෂා කර බැලීමෙන් ලාංකීය රූපවාහිනිය තුළ විකාශනය වන්නා වූ  බොහෝ ඉන්දියානු ටෙලිනාට්‍යවල ශානරීය ලක්ෂණයන් දක්නට ලැබෙන බව මෙම අධ්‍යයනය මගින් බොහෝ දුරට තහවුරු කෙරේ.

**ආශ්‍රිත ගන්ථ නාමාවලිය**


- නව විචාර සංකල්පය, විසිදුණු ප්‍රකාශණයෝ, බොරලැස්ගමුව, 1වන  මුද්‍රණය 2004
- සුරවීර ඒ ඒ — සාහිත්‍ය විචාර ප්‍රදීපිකා, ඇස් ගොඩගේ හා සහෝදරයෝ, කොළඹ 10, 2003

- කාරියවසම්, තිස්ස	චිත්‍රපටය සහ රූපවාහිණිය, ගොඩගේ හා සහෝදරයෝ, කොළඹ 10, 2004
- ඉන්දානන්ද හිමි, ඉදුනිල්පුර (සංස්කරණය)	ප්‍රදෙපායිනී, රන්කොත්ඔය, රජමහ විහාරය, තංගල්ල,2018